**ඇල්පිටිය ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.7,751,820 ක් වෙනුවෙන් ගිණුම් වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ණයහිමි ප්‍රතිපාදන ඇති කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.12,135,127 ක් මූල්‍ය ප්‍රකාශනවල රු.12,266,954 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන / | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව |

| | | |
|---|---|---|
| උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.2,015,738 ක වෙනසක් විය. | කිරීමට කටයුතු කළ යුතුවේ. | දන්වමි. |

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලැබිය යුතු ගිණුම් | | |
| දිගු කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් තිබෙන බැකෝ යන්ත්‍ර ආදායම් රු.940,837 ක් හා කර්මාන්ත සඳහා ලැබිය යුතු රු.62,475 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීම කළයුතු වේ. | ආදායම් අයකිරීම් සම්බන්ධව දිගින් දිගටම දැනුවත් කර ඇත. ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) ගෙවිය යුතු ගිණුම් | | |
| ඉකුත් වර්ෂයන්ට අදාළව ගෙවිය යුතු රු.727,190 ක් වූ ශේෂ 04 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි | නිරවුල් කිරීම කළයුතු වේ. | ඉදිරියේදී විධිමත් පරිදි ගෙවීමට කටයුතු කරමි. |

### 1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.109,954,372 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| (i) 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.3,393,672 ක් වූ කඩ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී වගන්ති ප්‍රකාරව කටයුතු කරමි. |
| (ii) 132 වගන්තිය | ප්‍රාදේශීය සභා අරමුදල භාවිතා කළ නොහැකි කාර්යයන් සඳහා රු.235,000 ක් වැයකර තිබුණි. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී වගන්ති ප්‍රකාරව කටයුතු කරමි. |
| **(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | වරිපනම් බදු සම්බන්ධ දේපල තහනම් කිරීමට අදාළ කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී වගන්ති ප්‍රකාරව කටයුතු කරමි. |
| (ii) රීති 59 | සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණ පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | සභා බල ප්‍රදේශයට අයත් කර්මාන්ත පිළිබඳ ලැයිස්තු පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සඳහා අතිරික්තතා හා ඌනතාවලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් පිළියෙල කර නොතිබුණි. | නියමිත පරිදි පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) රීති 218 | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කර නොතිබුණි. | සියළුම ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කර වාර්තා ගත කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | මුදල් රෙගුලාසි 570 හා 571 | අවුරුදු 02 ක කාලය ඉක්ම වූ රු.85,000 ක් වටිනාක තැන්පතු ශේෂයක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | 2015 ජූලි 10 දිනැති අංක PFD/ASD/ 02/VEH/CIR/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | ධාවනයෙන් ඉවත් කල වාහන 04 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 චක්‍රලේඛය | සභාව සතු වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව කර නොතිබුණි. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | 2010 දෙසැම්බර් මස 27 දින පළාත් පාලන කොමසාරිස්ගේ 2010/01 චක්‍රලේඛයේ 5 වන වගන්තිය | කඩ කාමර 43 ක් සම්බන්ධ බදු ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාර ගිවිසුම් යාවත්කාලීන කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.31,493,028 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.25,251,341 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,133,000 | 4,068,620 | 2,243,642 | 15,385,737 | 3,077,000 | 3,193,888 | 1,648,687 | 13,560,759 |
| කුලී | 2,060,000 | 2,190,345 | 1,754,790 | 3,393,672 | 2,060,000 | 2,059,200 | 2,408,550 | 2,958,117 |
| බලපත්‍ර ගාස්තු | 800,000 | 895,058 | 882,578 | 105,534 | 900,000 | 977,459 | 906,965 | 93,054 |
| වෙනත් ආදායම් | 13,200,000 | 36,289,872 | 29,000,000 | 28,732,322 | 12,500,000 | 24,237,553 | 17,500,000 | 21,442,450 |
| | 19,193,000 | 43,443,895 | 33,881,010 | 47,617,265 | 18,537,000 | 30,468,100 | 22,464,202 | 38,054,380 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.27,895,755 ක් හා උසාවි දඩ රු.836,567 ක් ලැබිය යුතුව තිබුණි. | ලැබිය යුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අදාළ ආදායම් අය කර ගැනිමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යයසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවට අනුව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) සණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසළ කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් දීර්ඝකාලීන සැලැස්මක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | කසල කළමනාකරණය සඳහා විධිමත් සැලැස්මක් සකස් කළ යුතුවේ. | ඉදිරියේ දී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ඇ) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභාබල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්ඝකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතුවේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරමින් පවතී. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආදාහනාගාරය 2019 සැප්තැම්බර් 26 දින සිට අක්‍රීය තත්ත්වයට පත්ව තිබූ අතර, අවශ්‍ය අළුත්වැඩියාවන් කිරීමට කටයුතු නොකිරීමෙන් ආදාහනාගාරයේ විමිණිය සම්පූර්ණයෙන්ම කඩා වැටී වහලට ද හානි වී තිබුණි. | අළුත්වැඩියා කටයුතු නොපමාව සිදු කිරීමට කටයුතු කළ යුතුවේ. | දැනටමත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක සංඛ්‍යා සැලැස්මට අනුව අනුමත තනතුරුවල පවතින පුරප්පාඩු 12 ක් සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත 05 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**3.4 නිෂ්ඵල වියදම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වරිපනම් මෘදුකාංගයක් මිලදී ගැනීම සඳහා 2014 වර්ෂයේ රු.137,000 ක් ගෙවා තිබුණි. 2019 නොවැම්බර් වන විට එම වරිපනම් පැකේජය සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබූ බැවින් ඒ සඳහා වැය කල මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි. | අදාල මෘදුකාංගය සක්‍රීය කරගත යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |